# වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය

## පුරප්පාඩු

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ***ප්‍රධාන විධායක නිලධාරී (අධ්‍යක්ෂ ) - පුරප්පාඩු 01***

- **සුදුසුකම්**

➢ **බාහිර :**

**වෘත්තිය සුදුසුකම් :**

පළමුවැනි හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත සිව් අවුරුදු (04) විද්‍යා හෝ කෘෂිකර්ම උපාධිය සහ අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (Ph.D)

**පළපුරුද්ද :**

අ) පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර විස්සක (20) පර්යේෂණ/කළමනාකරණ මට්ටමේ පර්යේෂණ පළපුරුද්ද. එයින් වසර දොළහක් (12) ආචාර්ය (Ph.D) උපාධිය ලබාගැනීමෙන් පසුව විය යුතු අතර, අවම වශයෙන් වසර පහක් (05) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක විය යුතුය.

**සහ**

ආ) විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ විද්‍යාඥයින් සඳහා නායකත්වය ලබාදීමේ සහ මෙහෙයවීමේ හැකියාව පෙන්නුම් කළ යුතුය. මානව සහ සෙසු සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සළකනු ලැබේ.

➢ **අභ්‍යන්තර :**

**වෘත්තීය සුදුසුකම් :**

අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (Ph.D)

**පළපුරුද්ද :**

අ) රබර් පර්යේෂණ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ ලෙස අවම වශයෙන් වසර තුනක (03) සතුටුදාය සේවයක් සපුරා තිබීම හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ ලෙස වසර පහක (05) හෝ දෙපාර්තමේන්තු ප්‍රධානි/ප්‍රධාන පර්යේෂණ නිලධාරි/ප්‍රධාන උපදේශක නිලධාරි ලෙස වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබිම

**සහ**

ආ) විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ විද්‍යාඥයින් සඳහා නායකත්වය ලබාදීමේ සහ මෙහෙයවීමේ හැකියාව පෙන්නුම් කළ යුතුය. මානව සහ සෙසු සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සළකනු ලැබේ.

- **වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- **සේවා කාණ්ඩය :** ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවය (HM 2-3)
- **වැටුප් පරිමාණ :** රු.173,000 – 12 x 4,850 – රු.231,200.00

- **අනෙකුත් ප්‍රතිලාභ :**

  මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.

  i. ජීවන වියදම් දීමනාව
  ii. ප්‍රවාහන දීමනාව හෝ වෙන් කරන ලද නිල රථය
  iii. ඉන්ධන දීමනාව
  iv. වෘත්තීය දීමනාව
  v. සන්නිවේදන දීමනාව
  vi. ගෘහභාණ්ඩ සහිත ආයතනය මගින් නඩත්තු කරන අංග සම්පූර්ණ නිල නිවාසයක් ලබාදේ.

- **රැකියා විස්තරය :** රබර් පර්යේෂණායතනයේ සියළුම පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්, පරිපාලනය සහ මූල්‍යමය කටයුතු පිළිබඳ වගකීම් දැරීම හා කාර්යය මණ්ඩලයට දිරි දෙමින් නායකත්වය සැපයීමේ කාර්යය භාරය උසුලන ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී වේ.

- **තේරීමේ ක්‍රමය :** පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## *2. නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව) - පුරප්පාඩු 01*
## *3. නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (තාක්ෂණ) - පුරප්පාඩු 01*

- **සුදුසුකම් :**

  ➢ **බාහිර**

**වෘත්තිය සුදුසුකම්**

පළමුවැනි හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත සිව් අවුරුදු (04) විද්‍යා හෝ කෘෂිකර්ම උපාධිය සහ අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (Ph.D)

**පළපුරුද්ද :**

අ) පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර දහසයක (16) කළමනාකරණ මට්ටමේ පර්යේෂණ පළපුරුද්ද හා කළමනාකරණ පළපුරුද්ද. එයින් වසර අටක් (08) ආචාර්ය උපාධිය (Ph.D) ලබාගැනීමෙන් පසුව විය යුතු අතර, අවම වශයෙන් වසර දෙකක් (02) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක විය යුතුය.

**සහ**

ආ) විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ විද්‍යාඥයින් සඳහා නායකත්වය ලබාදීමේ සහ මෙහෙයවීමේ හැකියාව පෙන්නුම් කළ යුතුය. මානව සහ සෙසු සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සළකනු ලැබේ.

➢ **අභ්‍යන්තර :**

**වෘත්තිය සුදුසුකම්**

අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (PhD)

**පළපුරුද්ද :**

අ) රබර් පර්යේෂණ ආයතනයේ දෙපාර්තමේන්තු ප්‍රධානි/ප්‍රධාන පර්යේෂණ නිලධාරි/ප්‍රධාන උපදේශක නිලධාරි ලෙස අවම වශයෙන් වසර හතරක (04) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

**සහ**

ආ) විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ විද්‍යාඥයින් සඳහා නායකත්වය ලබාදීමේ සහ මෙහෙයවීමේ හැකියාව පෙන්නුම් කළ යුතුය. මානව සහ සෙසු සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සළකනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවය (HM 1-3)

- **වැටුප් පරිමාණ** : රු.152,500 – 15 x 4,100 – රු.214,000.00

- **අනෙකුත් ප්‍රතිලාභ** :

මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.

i. ජීවන වියදම් දීමනාව
ii. ප්‍රවාහන දීමනාව හෝ වෙන් කරන ලද නිල රථය
iii. ඉන්ධන දීමනාව
iv. වෘත්තීය දීමනාව
v. සන්නිවේදන දීමනාව

- **රැකියා විස්තරය** : රබර් වගාව, රබර් සැකසීම සහ තාක්ෂණික දැණුම සම්ප්‍රේශනය කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- **තේරීමේ ක්‍රමය** : පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 4. *නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) - පුරප්පාඩු 01*

- **සුදුසුකම්** :

➢ **බාහිර**

අ). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධිය

**සමඟ**

ආ). රාජ්‍ය පරිපාලනය/ව්‍යාපාර පරිපාලනය/කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය

**සහ**

ඇ). පිළිගත් රජයේ සංස්ථාවක හෝ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක පරිපාලනය සහ පිරිස් කටයුතු පිළිබඳ අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ වසර දොළහක (12) සේවා පළපුරුද්ද

➢ **අභ්‍යන්තර** :

**වෘත්තිය සුදුසුකම්**

අ). ඉහත බාහිර අයදුම්කරුවන්ට අදාල සුදුසුකම් සපුරා තිබීම

**හෝ**

ආ). මධ්‍යම කළමනාකරණ මට්ටමේ (MM) පළමු ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරි ලෙස අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවය (HM 1-2)

- **වැටුප් පරිමාණ** : රු.143,120 – 15 x 4100 – රු.204,620.00

- **අනෙකුත් ප්‍රතිලාභ :**

  මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
  i. ජීවන වියදම් දීමනාව
  ii. ප්‍රවාහන දීමනාව හෝ වෙන් කරන ලද නිල රථය
  iii. ඉන්ධන දීමනාව
  iv. වෘත්තීය දීමනාව
  v. සන්නිවේදන දීමනාව

- **රැකියා විස්තරය :** ආයතනයේ පරිපාලන හා මානව සම්පත් කළමනාකරණය/සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම

- **තේරීමේ ක්‍රමය :** පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කොන්දේසි**

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
2. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් පසුවිය යුතුයි
3. අයදුම්කරු දිවයින තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතුයි.

**පොදු ප්‍රතිලාභ**

1. 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා පනත යටතේ හා 2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 අනුව පාරිතෝෂික ගෙවනු ලැබේ.
2. දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
3. අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල (අපේක්ෂකයන් විසින් වැටුපෙන් 10% ක් හා මණ්ඩලය විසින් 15% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා ද දායක වනු ඇත.)
4. රබර් පර්යේෂණායතනයේ සේවකයින් හට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභ ද හිමිවනු ඇත.

**අයදුම්පත් ක්‍රියාවලිය**

අයදුම්කරුවන් විසින් උප්පැන්න සහතිකය සහ අනෙකුත් අදාළ සියළුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත්වල සහතික කළ පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග අයදුම්කරුවන් විසින් අත්සන් කරන ලද තම අයදුම්පත 2026.03.30 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, රබර් පර්යේෂණ මණ්ඩලය, තෙලවල පාර, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ප්‍රමාදවී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන නිලධාරීන් තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකි ය.

ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.

අදාල සහතිකවල පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන ලබන බව කාරුණිකව සලකන්න.

මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

සභාපති
රබර් පර්යේෂණ මණ්ඩලය
තෙලවල පාර
රත්මලාන.
2026.03.04